Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

| | | |
|---|---|---|
| ශ්‍රේණිය - 10 | විෂය - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | සතිය - අප්‍රේල් 02 සතිය |

(01) ලොව පුරා පැතිර යන කොරෝනා වසංගතය අයත් වන්නේ කුමන පරිසර සාධකයකටද ?

(02) කොරෝනා වසංගතය හේතුවෙන් ව්‍යාපාර වලට දේශපාලන, ආර්ථික, ගෝලීය හා නෛතික පරිසරයට බලපෑම් සිදු වූ ආකාරය ව්‍යාපාර 3ක් ඇසුරින් උදාහරණ සහිතව දක්වන්න.

(03) කොරෝනා වෛරසය හේතුවෙන් ව්‍යාපාර පරිසරයේ සිදු වූ යහපත් හා අයහපත් ප්‍රතිඵල, ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන වශයෙන් වෙන වෙනම ලැයිස්තු ගත කරන්න.

(04) ආර්ථික පරිසරයට අයත් සාධක 5ක් කෙටියෙන් හඳුන්වන්න.

(05) ළමා ඇඳුම් මැසීම පිළිබඳ ඩිප්ලෝමාධාරිනියක වූ දිලිනි, මෝස්තර නිර්මාණ ශිල්පියකු වන දිලාන් සමග සමානව ප්‍රාග්ධනය යොදා "දිලූ ටෙක්ස්" නමින් ළමා ඇඳුම් මසා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පෙර පාසලක් අසලින් ගොඩනැගිල්ලක් මිලදී ගෙන ආරම්භ කරන ලදී.

ඉහත සිද්ධියේ සඳහන් දිලූ ටෙක්ස් ව්‍යාපාරයේ අවස්ථාවක් වන්නේ,

1. ව්‍යාපාරය පෙර පාසලක් අසල පිහිටා තිබීම ය.
2. දිලිනි ළමා ඇඳුම් මැසීම පිළිබඳ ඩිප්ලෝමාධාරිනියක් වීම ය.
3. දිලාන් ව්‍යාපාරයට සම්බන්ධ කර ගැනීම ය.
4. දිලිනි හා දිලාන් සම සමව ප්‍රාග්ධනය යෙදවීම ය.

(06) ව්‍යාපාරයක ......................(1)...................... යෙදූ මුදලේ සුරක්ෂිතතාව පිළිබඳ ව උනන්දුවක් දක්වන අතර, ......................(2)...................... සාධාරණ වැටුප් ලබා ගැනීමට උනන්දුවක් දක්වති.

ඉහත ප්‍රකාශයේ (1) හා (2) යන ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. තරගකරුවෝ, සේවකයෝ
2. අයිතිකරුවෝ, සැපයුම්කරුවෝ
3. සේවකයෝ, අයිතිකරුවෝ
4. අයිතිකරුවෝ, සේවකයෝ

(07) ව්‍යාපාර පරිසරයේ සිදු වූ සිදුවීම් කීපයක් පහත දැක්වේ.

A - ආබාධිත රණවිරුවන් සැමරීම සඳහා දිනයක් ප්‍රකාශයට පත් කිරීම.

B - බැංකු පොලී අනුපාතය ඉහළ දැමීම.

C - පාරිභෝගික භාණ්ඩවල මිල ගණන් ඉහළ දැමීම.

මේවායින් ආර්ථික පරිසරයට අයත් සාධක පමණක් ඇතුළත් වන්නේ,

1 A හා B ය　　　2 A හා C ය

3 B හා C ය　　　4 A, B හා C යන සියල්ලම ය

(08) ව්‍යාපාරයක අයිතිකරු ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය නිම කිරීම ඔහුගේ ව්‍යාපාරයට

1 ශක්තියකි.　　　2 දුර්වලතාවකි.

3 අවස්ථාවකි.　　　4 තර්ජනයකි